# ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 75 — 1973 අගෝස්තු 31 වැනි සිකුරාදා — 1973.08.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(මෙහි වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට, වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිටු | | පිටු |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 171 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | 174 | විවිධ දැන්වීම් ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | — | | |



සැලකිය යුතුයි.—(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 32 දරන උද්භිද උද්‍යාන (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 33 දරන ණය මණ්ඩල සංශෝධන පනත 1973 අගෝස්තු 31 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ. (ii) මහනුවර තරුණ බෞද්ධ සමිති පනත් කෙටුම්පත 1973 අගෝස්තු 24 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී. (iii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් ද පළවේ.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදාල සියළුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් වතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සෙනසුරාදා දින හැර සෑම ක්‍රියාකාරී දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වා ද, සෑම වරුවේ දිනවල පෙරවරු නවයේ සිට පෙරවරු එකොළහයි තිහ දක්වා ද, ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරී දිනවල පස්වරු දෙක දක්වා ද, වරුවේ දිනවල පෙරවරු එකොළහ දක්වා ද, භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

---

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළ වන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළ කිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළ කිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළ කර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

171——බී 70997—9,247 (73/08)



...ධ පුස්තකාල ...

## විරෝධය දැක්වීම

**පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී. ඇම්. 7 දරණ පෝරම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.**

**ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.**

**විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.**

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32,085. (2) ලැබුන දිනය: 1969 නොවැම්බර් මස 11 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණු අයිතිකරු): ඉම්පීරියෙල් කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්, ඉම්පීරියල් කෙමිකල් හවුස්, මිල් බෑන්ක්, ලන්ඩනය එස්. ඩබ්ලිව්. 1, එංගලන්තය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් (කළම්බු) ලිමිටඩ්, තැ. පෙ. 352, කොළඹ. (5) පන්තිය: 50. (6) බඩු: රෙදිපිළි සඳහා ජලරොධක සංයෝග. (7) වෙළඳ ලකුණේ සටහන:

**DIPSANIL**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 නොවැම්බර් මස 14 දින.

8-1201/1 —73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32,084. (2) ලැබුණ දිනය: 1969 නොවැම්බර් මස 11 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ඉම්පීරියල් කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්, ඉම්පීරියල් කෙමිකල් හවුස්, මිල්බෑන්ක්, ලන්ඩනය එස්. ඩබ්ලිව්. 1. එංගලන්තය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් (කළම්බු) ලිමිටඩ්, තැ. පෙ. 352, කොළඹ. (5) පන්තිය: 1. (6) බඩු: කර්මාන්තවල භාවිතය පිණිස රසායනික නිෂ්පාදන. (7) වෙළඳ ලකුණේ සටහන:

**SOLIVAP**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 සැප්තැම්බර් මස 11 දින.

8-1201/2 —73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32,967. (2) ලැබුණ දිනය: 1970 සැප්තැම්බර් මස 3 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): හෙන්ට්ලි ගාමන්ට්ස් ලිමිටඩ්. (සමාගමේ ආඥාපණත යටතේ ලංකාවේ විධිමත්ව සංස්ථාපිත සමාගමකි) අංක 10, පරණ ගුවන් තොටුපළ පාර, රත්මලාන; නිෂ්පාදකයෝ සහ බෙදාහරින්නෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජේ. ඊ. සෙනෙවිරත්න මයා, කොල්ලුපිටිය පටුමග, කොළඹ 3. (5) පන්තිය: 50. (6) බඩු: වෙනත් පංතිවල අඩංගු නොවන, ඇත් දත්, ඇටකටු, හෝ ලී, පිදුරු සත්ව සහ ශාක ද්‍රව්‍ය වලින් නිෂ්පාදිත විවිධ භාණ්ඩ, දුම්බොන පයිප්ප, කුඩ බස්තම්, බුරුසු, රෙදි, කඹ තෙල්ගාර, බොත්තම් සියලුම වර්ගවල ඇසුරුම් මලු හා පෙසුම් භාණ්ඩ. (7) වෙළඳ ලකුණේ සටහන:

**PERMAPRESS]]**

මෙම වෙළඳ ලකුණ අංක 32,969 දරණ වෙළඳ ලකුණ ලියාපදිංචි කරණු ලැබුවහොත් හෝ ලැබූ විට එම ලකුණ ආශ්‍රිත කරණු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 සැප්තැම්බර් මස 19 දින.

8-1200/1—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32,847. (2) ලැබුණ දිනය: 1970 ජූලි මස 17 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): හෙන්ට්ලි ගාමන්ට්ස් ලිමිටඩ් (සමාගම් ආඥාපනත යටතේ විධිමත්ව ලංකාවේ සංස්ථාපිත සමාගමකි) අංක 10, පරණ ගුවන් තොටුපළ පාර, රත්මලාන; නිෂ්පාදකයෝ සහ බෙදාහරින්නෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජේ. ඊ. සෙනෙවිරත්න මයා, කොල්ලුපිටිය පටුමග, කොළඹ 3. (5) පන්තිය: 50. (6) බඩු: වෙනත් පංතිවල ඇතුලත් නොවන, ඇත් දත් වලින්, ඇටවලින් හෝ ලී, පිදුරු හණ සහ සත්ව සහ ශාක ද්‍රව්‍යවලින් නිෂ්පාදිත විවිධ භාණ්ඩ, දුම්බොන පයිප්ප කුඩ, බස්තම්, බුරුසු සහ කෙස් පීරන පනා, ලිබඩු ඔප දැමීමේ ආලේප තහඩු කූඩු, කීල් රෙදි, කුඩාරම්, රික් රෙදි, කඹ, තෙල්ගාර, බොත්තම් සහ සියලුම වර්ගවල බඩු ඇහිරීමේ මේස් මළු. (7) වෙළඳද ලකුණේ සටහන:

**HENTLEY**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 අගෝස්තු මස 29 දින.

8-1200/2—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 34,344, (2) ලැබුණ දිනය: 1972 ජූනි මස 13 දින. (3) ඉල්ලුම් කරු (වෙළඳ ලකුණ අයිතිකරු): මිච්ලින් සහ සයි (කොම්පැග්නිඒ ජෙනරලි ඩෙස් එස්ටැබ්ලිෂ්මන්ට්ස් මිචලින්) (ප්‍රන්සයේ නීති යටතේ සංස්ථාපිත මණ්ඩලයකි) එහි ලියාපදිංචි කාර්යාලය ක්ලෙමන්ට්-ෆෙරන්ඩ්හි, අංක 55 බී 88 දරණ ස්ථානයේ පිහිටි, ප්‍රන්සය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනය ඇත්නම් ඒ ලිපිනය: ඩී. එන්. තුරෙසිරාජා මයා., තැ. පෙ. 1464, කොළඹ. (5) පන්තිය: 13. (6) බඩු: වාහන රෝද. (7) වෙළඳ ලකුණේ සටහන:

**MICHELIN**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 මාර්තු මස 07 දින.

8-1207 —73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,091. (2) ලැබුණ දිනය: 1970 ඔක්තෝබර් මස 12 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): යූනියන් ප්ලේස් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් (සමාගම් ආඥාපණත යටතේ සංස්ථාපිත වගකීම සීමාසහිත සමාගමකි) එහි ලියාපදිංචි කාර්යාලය කුමාර වීදියේ, නාග ගොඩනැගිල්ලේ, අංක 81 2/8 දරණ ස්ථානයේ පිහිටි, කොළඹ 11, නිෂ්පාදකයෝ. (4) ලියුම් භාර දීම් සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ඩී. එන්. තුරෙසිරාජා මයා, තැ. පෙ. 1464, කොළඹ 11. (5) පන්තිය: 24. (6) බඩු: කපු සාරි රෙදි. (7) වෙළඳ ලකුණේ සටහන:

**FLORA**


මෙම වෙළඳ ලකුණ පළකරනු ලබන ගැසට් පත්‍රයේ එම නිවේදනයේ පිටපතක් එය පළවී මසක් ඇතුළත අංක 8920 දරණ නම් කරන ලද ලකුණ අයිතිකරුවන් වෙත ලේඛනගත තැපෑලෙන් යවා ඒ බවට සාධක වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කිරීමේ කොන්දේසියට යටත්ව මෙම ලකුණ පිළිගන්නා ලදී.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 ඔක්තෝබර් මස 13 දින.

8-1206 —73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

(1) වෙළඳ ලකුණේ අංකය: 31,910. (2) ලැබුණ දිනය: 1969 සැප්තැම්බර් මස 22 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): **මරික්කාර් ලෙබ්බේ හමීඩ් (ෆෝර් රෝසස් බීඩි. කම්පනි නමින් ව්‍යාපාරික)** 4 වන කොට්ඨාශය, කෙළින් වීථිය, මුත්තූර්; බීඩි නිෂ්පාදකයා. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: සී. එන්. තුරෙයිරාජා මයා, තැ. පෙ. 1464, කොළඹ. (5) පන්තිය: 45. (6) බඩු: බීඩි. (7) වෙළඳ ලකුණේ සටහන:




මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබීමෙන් "FRBCO" යන ඉංග්‍රීසි හෝඩියේ අක්ෂර වෙනුවෙන් තනි අයිතිය නොලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 මැයි මස 9 දින.
8-1208—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,003. (2) ලැබුණ දිනය: 1970 සැප්තැම්බර් මස 13 දින. (3) ඉල්ලුම් කරු (වෙළඳ ලකුණ අයිතිකරු): අතුරුගිරි ආරච්චිගේ පොඩිසිංඤෝ අතුරුගිරි, ඔගස්ටස් රංජිත් අතුරුගිරි සහ උපාලි ඉන්ද්‍රසේන අතුරුගිරි (රශ්මි ඉන්ඩස්ට්‍රීස් යනුවෙන් ව්‍යාපාරික) අංක 118, කෙළින් වීථිය, පල්ලේවෙල, බේකිං උදුන්, විදුලි භාණ්ඩ සහ ග්ලාස් ලූවර්ස් නිෂ්පාදනය කිරීම. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය:—. (5) පන්තිය: 18. (6) බඩු: කෑම පුළුස්සන පෝරණු. (7) වෙළඳ ලකුණේ සටහන:



ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 පෙබරවාරි මස 14 දින.

8-1204—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32,240. (2) ලැබුණ දිනය: 1969 දෙසැම්බර් මස 19 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු). fපාබෙන් fපැබ්‍රිකන් බේයර් ඇක්ටිඑන්ගෙසෙල්ෂාfප්ට් (ජර්මනියේ නීති යටතේ විධිමත්ව සංවිධානයවූ සමාගමකි) ලිවර්කුසන් බේයර් වර්ක්, බටහිර ජර්මනිය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ද සිල්වා සහ මැන්දිස් මහතුන්, තැ. පෙ. 884, කොළඹ. (5) පන්තිය 3. (6) බඩු: හෛසජ්ජික නිෂ්පාදන. (7) වෙළඳ ලකුණේ සටහන:

**B A Y O L I N**

**මෙම වෙළඳ ලකුණ අංක 2,703, 15,421, 19,227, 20,127, 22,456, 24,950, 27,344, 31,153 සහ අංක 32,395 දරණ වෙළඳ ලකුණු ලියා** පදිංචි කරනු ලැබුවහොත් හෝ ලැබූවිට එම ලකුණ හා සමග ද ආශ්‍රිත කරනු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජනවාරි මස 1 දින.

8-1202/1—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32,707. (2) ලැබුණ දිනය: 1970 මැයි මස 26 දින. (3) ඉල්ලුම් කරු (වෙළඳ ලකුණ අයිතිකරු) සිලෝන් ටුබැකෝ කම්පනි ලිමිටඩ් (ලංකාවේ විධිමත්ව සංස්ථාපිත සමාගමකි) එහි ලියාපදිංචි කාර්යාලය උතුරු ස්කිනර් පාරේ අංක 108 දරණ ස්ථානයේ පිහිටි, කොළඹ 13, සිගරට් සහ ධූම පානය පිණිස භාවිතා **කෙරෙණ දුම්කොළ නිෂ්පාදකයෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි** වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: —. (5) පන්තිය: 45. (6) බඩු: සකස් කළ හෝ නොකළ දුම්කොළ. (7) වෙළඳ ලකුණේ සටහන:




(අ) මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබීමෙන් "FILTER" යන වචනය සහ "3" ඉලක්කම "ROSES" යන වචනය සමග එක්ව විනා ඉන් පිටස්තරව භාවිතා කිරීම පිණිස තනි අයිතිය නොලැබේ.

(ආ) මෙම වෙළඳ ලකුණ අංක 3,499 හා 25,119 දරණ වෙළඳ ලකුණ හා ආශ්‍රිත කරනු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 අගෝස්තු මස 18 දින.

8-1205—73.08.31 දින අංක 31 දරණ ගැසට් පත්‍රය

(1) වෙළඳ ලකුණේ අංකය: 32,889. (2) ලැබුණ දිනය: 1970 අගෝස්තු මස 3 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): අග්ෆා-ගෙවර්ට් ඇක්ටිඑන්ගෙසේල්ෂාෆ්ට් (ජර්මනියේ නීති යටතේ විධිමත්ව සංවිධානයවූ සමාගමකි), ලිවර්කුසන්-බේයර්වර්ක්, බටහිර ජර්මනිය, නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ද සිල්වා සහ මැන්දිස් මහතුන්, තැ. පෙ. 884, කොළඹ. (5) පන්තිය: 1. (6) බඩු: ඡායා රූප වර්ධනය කිරීමේ සම්මිශ්‍රණ හා ද්‍රව්‍ය. (7) වෙළඳ ලකුණේ සටහන:

**REFINAL**


ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජනවාරි මස 1 දින.

8–1202/2—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 31,446. (2) ලැබුණ දිනය: 1969 මැයි මස 17 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): නිච්බන් කම්පැණි ලිමිටඩ්, (ජපානයේ නීති යටතේ සංවිධානය කරන ලද වෙළඳ සමාගමකි), අංක 2-4, කුඩන්මිනාමි 2-චෝම්, චියෝඩ-කු, ටෝකියෝ, ජපානය. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: මුරුගේසු හා කුලරත්න මහතුන්, පෙරකදෝරු වරු, 75 2/5, හේමාස්' ගොඩනැගිල්ල, කොළඹ. (5) පන්තිය: 39. (6) බඩු: කඩදාසි (පේපර් හැඟින්ස් හැර), ලිපි ද්‍රව්‍ය, සහ පොත් බැඳීමට ගන්නා ද්‍රව්‍ය. (7) වෙළඳ ලකුණේ සටහන:—



ජේ. ඇෆ්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1969 ජූලි මස 2 දින.

8–1202/3—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

## වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන

### ශුද්ධියකි

අංක 62 හා 1973 ජූනි මස 1 දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද අංක 34,055 හා 1971 දෙසැම්බර් මස 18 වන දින දරණ 3 වන පංතියේ වෙළඳ ලකුණ සම්බන්ධ සිංහල නිවේදනයේ 2 වන අංකය (ලැබුණ දිනය) පහත සඳහන් අයුරින් නිදොස් විය යුතුය.

2 වන අංකය: (ලැබුණ දිනය):—1971 දෙසැම්බර් මස 18 දින.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1. 1973 අගෝස්තු මස 8 දින.

8–1127—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම යැවිය යුතුය

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | 73.07.27 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | 73.08.03 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | 73.08.10 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | 73.08.17 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | 73.08.24 | සිකුරාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09 28 | සිකුරාද | 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.